# නීති විධිවිධාන - ව්‍යවහාර මුදල් නෝට්ටු ප්‍රතිනිෂ්පාදනය

(අ) 1949 අංක 58 දරන මුදල් නීති පනතේ (මු.නී.ප.) 58(d) වගන්තිය ප්‍රකාරව "මුදල් මණ්ඩලයේ අනුමැතියකින් තොරව කිසිදු ආකාරයකින් ඕනෑම ව්‍යවහාර මුදල් නෝට්ටුවක් ප්‍රතිනිෂ්පාදනය කිරීම හෝ පිටපත් කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි."

(ආ) දණ්ඩ නීති සංග්‍රහයේ 478අ. (1) සිට 478ඈ. වගන්ති ප්‍රකාරව:

478අ. (1) යම් මුදල් නෝට්ටුවක් හෝ බැංකු නෝට්ටුවක් කූට ලෙස සාදන හෝ කූට ලෙස තනන හෝ කූට ලෙස තැනීමේ හෝ සෑදීමේ වැඩෙහි යම් කොටසක් දැන දැනම ඉෂ්ට කරන තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතුය. ඔහු දඩයකට ද යටත් විය යුතුය.

478ආ. කූට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ මුදල් නෝට්ටුවක් හෝ බැංකු නෝට්ටුවක් කූට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ බව දනිමින් හෝ විශ්වාස කිරීමට කරුණු තිබිය දී යමකු එකී කූට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ මුදල් නෝට්ටුවක් හෝ බැංකු නෝට්ටුවක් වෙනත් තැනැත්තකුට විකුණවහොත්, වෙනත් තැනැත්තකුගෙන් මිලයට ගතහොත් හෝ ලබා ගතහොත් හෝ වෙනත් ලෙස අලෙවි කරතහොත් හෝ සත්‍ය වූවක් ලෙස පාවිච්චි කරතහොත් ඔහුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතුය. ඔහු දඩයකට ද යටත් විය යුතුය.

478ඇ. කූට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ මුදල් දනිමින් හෝ විශ්වාස කිරීමට කරුණු තිබියදී සත්‍ය වූවක් ලෙස පාවිච්චි කිරීමේ අදහසින් හෝ සත්‍ය වූවක් ලෙස පාවිච්චි කළ හැකි වන ලෙස යම් කූට ලෙස තනනු ලැබූ හෝ සාදනු ලැබූ මුදල් නෝට්ටුවක් හෝ බැංකු නෝට්ටුවක් ස්වාමිත්වයෙහි තබා ගන්නා වූ තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතු ය.

478ඈ. යම් මුදල් නෝට්ටුවක් හෝ බැංකු නෝට්ටුවක් කූට ලෙස තැනීමට හෝ සෑදීමට පාවිච්චි කිරීමේ කාර්‍යය සඳහා හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලැබූ බව දනිමින් හෝ විශ්වාස කිරීමට කරුණු තිබිය දී යම් යන්ත්‍රෝපකරණයක්, උපකරණයක් හෝ ද්‍රව්‍යයක් සාදන්නා වූ හෝ සෑදීමේ වැඩක යම් කොටසක් ඉෂ්ට කරන්නා වූ හෝ මිලයට ගන්නා වූ හෝ විකුණන්නා වූ හෝ අලෙවි කරන්නා වූ හෝ ස්වාමිත්වයෙහි තබා ගන්නා වූ තැනැත්තකුට අවුරුදු විස්ස දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකින් දඬුවම් කළ යුතු ය. ඔහු දඩයකට ද යටත් විය යුතුය.